Embassy of the United States of America
Colombo

# මාධ්‍ය නිවේදනය

Public Affairs Section
Tel: +94 (1) 249-8100 ● Fax: +94 (1) 244-9070
Email: VanHornNT@state.gov ● http://lk.usembassy.gov

Release No. 20180201

**එක්සත් ජනපදය සහ ශ්‍රී ලංකාව 70 වසරක සහයෝගීතාවය සමරනු ලබයි**

**පෙබරවාරි 01 වැනිදා කොළඹදීය.** ශ්‍රී ලංකාවේ 70 වැනි නිදහස් දිනය පෙබරවාරි 04 වැනිදා මහත් උත්කර්ෂවත් අන්දමින් සමරණු ලබයි. ඒ සමගින්ම ශ්‍රී ලංකාව හා එක්සත් ජනපදය අතර තානාපති සම්බන්ධතාවලටද 70 වසරක් සපිරේ. මෙම අභිමානවත් අවස්ථාව සැමරීම සඳහා කොළඹ එක්සත් ජනපද තානාපති කාර්යාලය ඉදිරි මාස 12 කාලසීමාවේදී වැඩසටහන් ගණනාවක් දියත් කරනු ලබයි. මේවාට සංස්කෘතික වැඩසටහන්, අධ්‍යාපනික අවස්ථාවන් මෙන්ම ශ්‍රී ලංකාවේ සියලුම සමාජ ආර්ථික පසුබිම් හා පළාත් නියෝජනය කරනු ලබන ප්‍රජාව සම්බන්ධවන #USASL70 ප්‍රවර්ධන ව්‍යාපාරය විශේෂ ස්ථානයක් ගන්නා අතර එමගින් ශ්‍රී ලංකාව හා එක්සත් ජනපදය අතර දශක 7 පුරා පැවැති අන්‍යොන්‍ය සහයෝගීතාවය සහ විශ්වාසය තවදුරටත් තහවුරු කරනු ලබයි.

“ අපගේ තානාපති කාර්යාලයේ සැවොම ශ්‍රී ලංකාවේ මිතුරන් හා පාර්ශවකරුවන් සමගින් මෙම මහඟු අවස්ථාව සැමරීමට මහත් සතුටින් සිටිනවා. ශ්‍රී ලංකාවට වැඩියෙන්ම විදේශ ආධාර ලබාදෙන රටක් ලෙස සහ ශ්‍රී ලංකාවේ විශාලතම වෙළඳ පාර්ශවකරුවා වශයෙන් දශක හතක කාලසීමාවක් පුරා ඇමෙරිකා එක්සත් ජනපදය ශ්‍රී ලංකාව සමග උරෙනුර ගැටෙමින් කටයුතු කර තිබෙනවා” යැයි තානාපති අතුල් කෙශප් මහතා පැවැසීය.

70 වන සංවත්සරය සැමරීම වෙනුවෙන් එක්සත් ජනපද තානාපති කාර්යාලය විසින් සංවිධානය කරනු ලබන විශේෂ ප්‍රසංගයක් සඳහා නිව්යෝර්ක් නගරයේ සුප්‍රසිද්ධ ජෑස් සංගීත කළාකරුවකු වන ක්ලිෆ් ගෝර්ඩන් පෙබරවාරි මස අවසාන භාගයේදී ශ්‍රී ලංකාවට පැමිණෙනු ඇත. කොළඹදී පවත්වනු ලබන ප්‍රසංග ගණනාවකට අමතරව ඔහු විශේෂ ශාලා ප්‍රසංගයකටද සහභාගී වනු ඇති අතර මෙය පොදු මහජනතාව සඳහා විවෘතය. මෙම වැඩසටහන් වලට අමතරව ඇමෙරිකානු චිත්‍රපට නිෂ්පාදකයින්ගේ සහභාගිත්වයෙන් පැවැත්වෙන චිත්‍රපට උළෙලක්, ඇමෙරිකාවේ විශ්ව විද්‍යාලවල පවත්නා අධ්‍යාපන අවස්ථාවන් විදහා දක්වන අධ්‍යාපනික ප්‍රදර්ශනයක් සහ ශ්‍රී ලංකාවේ තරුණයින් සඳහා වූ ක්‍රීඩා හුවමාරු වැඩසටහන් ද මෙම සැමරුම් උත්සව මාලාවට ඇතුළත්ය.

#USASL70 වැඩසටහන මගින් නව ද්විපාර්ශවීය සම්බන්ධතා පිළිබඳව විශේෂ අවධානය යොමු කරනු ඇති අතර මෙයට පීස් කෝර්ප් Peace Corps වැනි ද්විපාර්ශවීය ගිවිසුම් වලට අත්සන් තැබීමද ඇතුළත්ය. මෙම විශේෂ ප්‍රවර්ධන ව්‍යාපාරය යටතේ දෙරටේ යුධ හමුදා අතර අභ්‍යාස පැවැත්වීමට නියමිත අතර මෙමගින් ආපදාවන්ට ප්‍රතිචාර දැක්වීමේ ධාරිතාවන් නංවාලීමට හා එක්ව සහයෝගයෙන් මෙහෙයුම් කිරීමේ හැකියාව වැඩි දියුණු කිරීමට හැකිවේ. ශ්‍රී ලංකාවේ තරුණයින්ට 21 සියවසේ රැකියා අවස්ථාවන් සඳහා අවශ්‍ය දැනුම කුශලතා නංවාලීම සඳහා අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනය මගින් රැකියා පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලබන අතර මෙයට අමතරව ශ්‍රී ලංකාවේ කිරිගොවි කර්මාන්තයේ ඵලදායිත්වය නංවාලීමටද ඔවුන් සහාය ලබාදෙනු ඇත.

“#USASL70 වැඩසටහන මගින් අපගේ අතීතය දෙස හැරී බැලීමට වඩා වඩාත් ස්ථාපිත වූ ප්‍රජාතන්ත්‍රවාදය හා සාමය තුළින් අනාගත මෙම කළාපයේ සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවක් පිළිබඳව දැක්ම අවධාරණය කරනු ලබනවා. මෙම දැක්ම යථාවක් බවට පත් කිරීම සඳහා තවත් වසර 70 වැඩි කාලයකටත් වඩා ඔබ සමගින් එක්ව කටයුතු කිරීමට එක්සත් ජනපදය සැදී පැහැදී සිටිනවා” යැයි තානාපති අතුල් කෙශප් මහතා පැවැසීය.